# අපරාධ නඩු විධාන සංග්‍රහයේ යෝජිත සංශෝධයන් සිදු කිරීමට ක්‍රියා කිරීමෙන් වලකින ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී

**2016 ඔක්තොම්බර් 05 වන දා, කොළඹ, ශ්‍රී ලංකාව:** අපරාධ නඩු විධාන සංග්‍රයේ සංශෝධනයන් සම්බන්ධයෙන් දිගටම කටයුතු කිරීමට රජය අදහස් කිරීම පිළිබඳව 2016 ඔක්තෝම්බර් 02 වන දින මුද්‍රිත මාධ්‍ය වල වාර්තා වූ අධිකරණ අමාත්‍යවරයාගේ ප්‍රකාශය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි කනස්සල්ල පළ කර සිටී. සැකකරුවන් රඳවා තබා ගැනීම පිළිබඳව වූ මේ හා සමාන අත්තනෝමතික ක්‍රියාපටිපාටීන් සහ පරිපාලන නියෝගයන් හට අතීතයේදී ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අභියෝග කිරීමට යෙදුණු අතර අප දිගින් දිගටම රැඳවියන්ගේ අයිතිවාසිකම් විශේෂයෙන්ම නිසි ක්‍රියාදාමය පිළිබඳව වූ අයිතිවාසිකම් පිළිබඳව බලපෑම් කිරීමේ හා පෙනී සිටීමේ නියැලී සිට ඇත්තෙමු. වර්තමාන සංශෝධනය පිළිබඳ අපගේ දැඩි සැලකිල්ල යොමු වන්නේ ඒ මගින් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය, නෛතික සහ පරිපාලන ආරක්ෂණයන් සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම් වෙතින් ඉවතට ගමන් කිරීමක් සිදුවන බැවිනි. මෙම කෙටුම්පත් පනත එය වර්තමානයේ පවතින ආකාරයෙන් නීතියක් බවට පත් කිරීමට කටයුතු කිරීමෙන් වලකින ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී.

මෙම සංශෝධනය යෝජනා කරන කෙටුම්පත් පනත 2016 අගෝස්තු මස 12 දිනය දරන ගැසට් පත්‍රයට අතිරේකයක් ලෙස නිකුත් කරනු ලැබුවේ 2016 අගෝස්තු 15 වන දිනය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ තවත් සිවිල් සමාජ සංවිධාන කිහිපයක් විසින් එය විවේචනයට ලක් කරනු ලැබ තිබිණි. මෙසේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සහ ශ්‍රී ලංකා නීතිඥ සංගමය කාලෝචිත ලෙස මෙයට මැදිහත් වීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සතුටින් පිළිගනී. මානව හිමිකම් කොමිසමේ ලිපිය මගින් යෝජිත කෙටුම්පත් පනතේ පවතින බරපතල අඩුපාඩු ගනනාවක්ම සවිස්තරව දක්වා තිබිණි. යෝජිත සංශෝධනය නීතියක් ලෙස පනවනු ලැබුවහොත් එමගින් සැකකරුවන් හට වද හිංසා පැමිණවීමට, කෲර සහ අමානුෂික සැලකිලිවලට මෙන්ම නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමට හා රඳවා තබා ගැනීමට ලක් වීමට ඇති අනතුර වැඩිවන බව ද එම අඩුපාඩු අතර විය. එමෙන්ම නීතිඥ සංගමය විසින් ද එවැනිම කරුණු ගණනාවක් පිළිබඳව සඳහන් කරමින් ජනාධිපතිවරයා වෙත කරුණු දැක්වීමක් සිදුකර ඇති බව වාර්තා විය.

රාජ්‍යය විසින් රඳවාගනු ලබන පුද්ගලයන් වදහිංසා පැමිණවීමට භාජන වීම වැළැක්වීම සඳහා රජයට ඇති බැඳීම් මෙන්ම යුරෝපා සංගමය වෙතින් GSP+ වරණීය බදු ක්‍රමය ලබා ගැනීම සඳහා දරනු ලබමින් පවත්නා උත්සාහයන් ද සැලකිල්ලට ගත් කළ මෙම කෙටුම්පත් පනත නීතියක් බවට පත් කිරීම සඳහා දිගටම කටයුතු කරගෙන යාමට රජය විසින් දැඩිලෙස පෙළඹී සිටීම විශේෂයෙන්ම ප්‍රශ්ණකාරී වෙයි.

වැඩිදුරටත්, මෙම කෙටුම්පත් පනත ගැසට් කරනු ලැබූ ක්‍රියාදාමය සහ අධිකරණ අමාත්‍යවරයාගේ ප්‍රකාශය ශ්‍රී ලංකාවේ නීති සම්පාදන ක්‍රියාදාමයේ පවත්නා විශාල ගැටළු සහගත තත්ත්වයන් පිළිබඳව වූ දර්ශකයක් ද වෙයි. නීති සම්පාදන ක්‍රියාදාමයේ වැඩි විනිවිදභාවයක් සහ මහජන සහභාගීත්වයක් ඇති බව බවට සහතික කර ගැනීම සඳහා පියවර ගන්නා ලෙස වරින් වර බලයට පත් වූ රජයයන්ගෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත නැවතත් ඉල්ලීම් කරනු ලැබ ඇත. අවම වශයෙන් මේ සඳහා නීති කරණයන් කෙටුම්පත් කිරීමට පෙර අදාළ පරදුපාර්ශවයන් සමග සාකච්ඡා කිරීම හා ඔවුන්ගේ මතය විමසීම මෙන්ම කෙටුම්පත් නීති කරණයන් වෙත ජනතාවට වැඩි ප්‍රවේශයක් ලබා දීම අවශ්‍ය වනු ඇත. දැනට සිදුවෙමින් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය ද සැලකිල්ලට ගෙන ඉතාම හදිසි පදනමක් මත මෙම නීති සම්පාදන ක්‍රියාදාමයේ ක්‍රමය පිළිබඳව වූ ගැටළු වලට ආමන්ත්‍රණය කිරීමට පියවර ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී.